8953



සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

**51 S I**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

විභාග අංකය : ....................................

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

**I කොටස**
- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.**
- එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියෙන් ඇති **තිත් ඉර මත** ලියන්න.

**II කොටස**
- අනුකොටස් **තුනකින්** සමන්විත ය.
- '**අ**' කොටසින් ප්‍රශ්න **දෙකක්** හා '**ආ**' සහ '**ඉ**' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

※ **I** කොටසට හා **II** කොටසට අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

| පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණයි. | |
|---|---|
| **I පත්‍රය සඳහා** | |
| **කොටස** | **ලකුණු** |
| I | |
| II | |
| **එකතුව** | |
| 1 වැනි පරීක්ෂක | 2 වැනි පරීක්ෂක |
| | |

## I කොටස

● ප්‍රශ්න අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** තෝරන්න.

**1.** නූතන කලා ප්‍රයෝග ඇසුරෙන් චිත්‍රනය වූ 'ජේන භවන' සිතුවම කළ ශිල්පියා වනුයේ,
(1) අයිවන් පීරිස් ය.
(2) හැරී පීරිස් ය.
(3) ඩබ්ලිව්. ජේ. ජී. බීලිං ය.
(4) රිචඩ් ගේබ්‍රියල් ය.
(5) එල්.ටී.පී. මංජු ශ්‍රී ය. (.........)

**2.** මිසර චිත්‍ර නිර්මාණයේ දී මූලිකව ම අපේක්ෂා කරන ලද්දේ,
(1) පාරාවරුන්ගේ ජීවන තොරතුරු වාර්තා කර තැබීමයි.
(2) පාලකයන්ගේ බල පරාක්‍රමය පෙන්වීමයි.
(3) පාරාවරුන්ගේ ආගමික ඇදහිලි හා විශ්වාස පෙන්වීමයි.
(4) පාරාවරුන්ගේ යුධ ජයග්‍රහණ පෙන්වීමයි.
(5) පාරාවරුන්ගේ දඬුවම් දර්ශන පෙන්වීමයි. (.........)


**3.** ගම්පොළ යුගයේ නිර්මාණය වූ බුදු පිළිම තුළ දක්නට ඇති සුවිශේෂී ලක්ෂණය වනුයේ,
(1) ජ්‍යාමිතික හැඩැති සිරුර හා අධ්‍යාත්මික ගුණ නිරූපණයයි.
(2) හින්දු කලා ලක්ෂණ අනුව විවෘත දෙනෙත් නිරූපණයයි.
(3) පුළුල් දෙවුර හා පෞරුෂ ලක්ෂණ ආරෝපණය කිරීමයි.
(4) රිද්මයානුකූල දියරැළි ආකාර චීවරය හා ප්‍රකාශනයයි.
(5) කේතුමාලා සිරස්පත පොදු ලක්ෂණයක් ලෙස යොදා ගැනීමයි. (.........)

[දෙවැනි පිටුව බලන්න.

4. අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා ම සඳකඩ පහනේ පැවති, එහෙත් ක්‍රමිකව වෙනසකට ලක් වූයේ,
   (1) තීරු බෙදා වෙන් කළ ආකාරයයි.
   (2) අඩ නෙළුම පූර්ණ නෙළුමක් වූ ආකාරයයි.
   (3) කලා අංග ස්ථානගත කළ පිළිවෙලයි.
   (4) ගිනි දැල්ලේ ස්වරූපය හා ප්‍රමාණයේ වෙනසයි.
   (5) සත්වාවලියේ දිශානතියේ සිදු වූ වෙනසයි. (.........)

5. ඉන්දීය මාමල්ලපුරම්හි පංච පාණ්ඩව රථ දේවාල අතර දෙමහල් රථය වන්නේ,
   (1) අර්ජුන රථයයි.
   (2) ධර්මරාජ රථයයි.
   (3) ද්‍රවුපදී රථයයි.
   (4) නකුල සහදේව රථයයි.
   (5) භීම රථයයි. (.........)

- ප්‍රශ්න අංක **6** සිට **10** තෙක් අසා ඇති ප්‍රශ්නවලට **වඩාත් ගැළපෙන වරණය 1** සිට **9** තෙක් අංක කර ඇති පහත සඳහන් පින්තූර ඇසුරෙන් තෝරන්න.



1


2


3


4


5


6


7


8


9

6. වාස්තු විද්‍යාත්මක අංගයන් ලෙස නිම කරන ලද කලා කෘති මොනවා ද?
   (1) **2,3,4** (2) **3,4,7** (3) **4,5,6** (4) **4,6,7** (5) **5,6,7** (.........)

7. මිත්‍යා රූප ඇසුරෙන් කරන ලද කලා නිර්මාණ මොනවා ද?
   (1) **2,5** (2) **5,6** (3) **6,7** (4) **6,9** (5) **7,9** (.........)

8. ඓතිහාසික පුරාවෘත්ත හා බැඳි නිර්මාණ මොනවා ද?
   (1) **1,3** (2) **1,5** (3) **1,6** (4) **3,6** (5) **6,8** (.........)

9. නෙළීමේ ශිල්ප ක්‍රමය භාවිතයෙන් කළ නිර්මාණ මොනවා ද?
   (1) **1,2,4,5** (2) **1,2,4,7** (3) **1,2,6,9** (4) **1,3,6,9** (5) **4,6,8,9** (.........)

10. වාත්තු ශිල්ප ක්‍රම පදනම් කරගෙන කළ නිර්මාණ මොනවා ද?
   (1) **2,5,6** (2) **2,5,8** (3) **5,6,7** (4) **6,7,8** (5) **7,8,9** (.........)

● ප්‍රශ්න අංක **11** සිට **15** තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය A, B, C, D, E** ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.


A


B


C


D


E

**11.** **A** අක්ෂරයෙන් දැක්වෙන ආලේඛ්‍ය සිතුවම,
(1) ජේ.ඩී.ඒ. පෙරේරා ශිල්පියාගේ ය.
(2) ස්ටැන්ලි අබේසිංහයන්ගේ ය.
(3) ඒ.සී.ජී.එස්. අමරසේකරයන්ගේ ය.
(4) හැරී පීරිස් ශිල්පියාගේ ය.
(5) ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ ය. (.........)

**12.** **B** අක්ෂරයෙන් දැක්වෙන මේරි කසාට් ශිල්පිනියගේ සිතුවම තුළ,
(1) ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී ක්‍රමෝපායන් භාවිත කර ඇත.
(2) හුදකලාව හා විවිධ මානසික ව්‍යාකූලතා ඉස්මතු කර ඇත.
(3) වර්ණවල ඇති පසමිතුරුභාවය සංරචන උපක්‍රම ලෙස භාවිත කොට ඇත.
(4) සම්භාව්‍ය සංරචන ක්‍රමවේදයන් අනුගමනය කර ඇත.
(5) පසුබිම අත්‍යවශ්‍ය අංගයක් සේ නිරූපණය කර ඇත. (.........)

**13.** **C** අක්ෂරයෙන් දැක්වෙන ජස්ටින් දැරණියගල ශිල්පියාගේ සිතුවම,
(1) නිරූපණාත්මක මෙන් ම ශෛලිගත ලක්ෂණ පෙන්නුම් කරයි.
(2) වස්තූන්ගේ ස්වභාවය ප්‍රකෘති ස්වභාවයෙන් ඉදිරිපත් කරයි.
(3) ප්‍රකාශනවාදී කලා ලක්ෂණ සහිත මධ්‍යගත සංරචනයකි.
(4) ශාස්ත්‍රාලයීය ශිල්ප ක්‍රමය අනුව කළ ප්‍රකාශනයකි.
(5) යථාරූපී මෙන් ම ඝණිකවාදී කලා ලක්ෂණ ද සම්මිශ්‍රිත ප්‍රකාශනයකි. (.........)

**14.** **D** අක්ෂරයෙන් දැක්වෙන ඩබ්ලිව්.ජේ.ජී. බීලිං ශිල්පියාගේ සිතුවම,
(1) හැඩතල ද්විමාන ස්වරූපයෙන් තලය පුරා විසිරෙන සේ දක්වා ඇත.
(2) ස්වාභාවික හා නිර්මාණාත්මක හැඩතල සමූහයක් එකතුවෙන් කළ නිර්මාණයකි.
(3) විසංගත වර්ණ භාවිතයෙන් ප්‍රකෘති ස්වභාවය විකෘති කර දක්වයි.
(4) නිශ්චල ද්‍රව්‍ය සමූහයක් ඝණිකවාදී ස්වරූපයෙන් කළ ප්‍රකාශනයකි.
(5) ද්විමාන හා ත්‍රිමාන හැඩතල අර්ථවත්ව එකට ගැළපීමකි. (.........)

**15.** **E** අක්ෂරයෙන් දැක්වෙන අම්රිතා ශර්ගිල් ශිල්පිනියගේ සිතුවම,
(1) ශාස්ත්‍රාලයීය දැනුමෙන් පෝෂිත චිත්‍රමය භාෂාවකින් සමන්විත වූවකි.
(2) සම්භාව්‍ය වර්ණ මාලාවකින් සම්භාව්‍ය නොවන තේමාවක් හැඩ කිරීමකි.
(3) ගැමි සංස්කෘතිය, ශෛලිගත ආකාරයකින් ගොඩනැංවූවකි.
(4) බහු වාර්ණික ස්වරූපයෙන් තේමාව අර්ථ දැක්වීමකි.
(5) නූතනවාදී කලා ප්‍රවේශය ශෛලිගතව ඉදිරිපත් කිරීමකි. (.........)

Past Papers Wiki




● ප්‍රශ්න අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** පහත සඳහන් **F, G, H, I, J** ලෙස නම් කර ඇති කැටයම් ඡායාරූප ඇසුරෙන් තෝරන්න.



F




G



H



I



J

**16.** **F** අක්ෂරයෙන් දැක්වෙන ඇම්බැක්කේ දේවාලයේ කැටයම
(1) මානව රූප කිහිපයක් දේශීය ලක්ෂණ සහිතව කළ නිර්මාණයකි.
(2) දැව කැටයම් ශිල්පියාගේ විශිෂ්ටත්වය දැක්වෙන නිර්මාණයකි.
(3) දැව මාධ්‍යයේ ස්වභාවය ඉස්මතුවන ආකාරයට කරන ලද්දකි.
(4) පනේලය තුළ කළ විරල තේමා සංරචනයකි.
(5) සමකාලීන සමාජයීය තේමාවක් අල්ප උන්නතව දැක්වීමකි. (.........)

**17.** **G** අක්ෂරයෙන් දැක්වෙන්නේ
(1) නාටිකාංගනාවන් නිරූපිත පනේල කැටයමකි.
(2) ආගමික පෙරහැරක් දැක්වෙන පනේල කැටයමකි.
(3) ගඩලාදෙණිය ද්වාර මණ්ඩපයේ දක්නට ඇති අල්ප උන්නත කැටයමකි.
(4) යාපහුව රාජමන්දිරයේ පාදමේ දක්නට ඇති පනේල කැටයමකි.
(5) නටන වයන කාන්තා රූ ඇතුළත් පනේල කැටයමකි. (.........)


**18.** **H** අක්ෂරයෙන් දැක්වෙන සාංචි තොරණේ
(1) බෞද්ධාගමික පුවත් කැටයමට නගා ඇත.
(2) බුද්ධ චරිතයේ සිද්ධි ඇසුරෙන් පමණක් උඩලිපත් කැටයම් කර ඇත.
(3) සිරස් කුලුණු කැටයම් කර ඇත්තේ ඓතිහාසික පුවත් ඇසුරෙනි.
(4) සංකේත භාවිත කොට බුදුසිරිතේ සිද්ධි නිරූපණය කර ඇත.
(5) උඩලිපත් කැටයම් අඛණ්ඩ කථන ක්‍රමයෙන් කර ඇත. (.........)

**19.** **I** අක්ෂරයෙන් දැක්වෙන අමරාවතියේ නාලාගිරි දමනය කැටයම
(1) ශිල්පියාගේ භාව ප්‍රකාශන හැකියාව මනාව ඉස්මතු කළ විශිෂ්ට පනේල නිර්මාණයකි.
(2) තලය පුරා මානව හා සත්ත්ව රූප විසිරී යන පරිදි කළ කැටයමකි.
(3) ඇත් රුව දෙවතාවක් යෙදීම මගින් ඒකකාරී සම්පිණ්ඩනයක් පෙන්නුම් කරන්නකි.
(4) ජීවය හා ක්‍රියාකාරීත්වය අවම මට්ටමක නිරූපිත වෘත්තාකාර පුවරුවකි.
(5) ශිල්පියාගේ සංකේත භාවිතය ඉතා ඉහළ මට්ටමින් පෙන්වන නිර්මාණයකි. (.........)

**20.** **J** අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) රෝමවරු තම යුධ ජයග්‍රහණ පුවත් යොදා කළ ආරුක්කු කැටයමකි.
(2) ජෙරුසලම වටලෑම දැක්වෙන රෝම ආරුක්කු කැටයමකි.
(3) රෝම වාස්තුවිද්‍යා නිර්මාණයක් අලංකාර කළ කැටයමකි.
(4) ඩේසියානු හමුදාවේ පරාජය දැක්වෙන ආරුක්කු කැටයමකි.
(5) කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයාගේ යුධ ජයග්‍රහණ දැක්වෙන ආරුක්කු කැටයමකි. (.........)


● ප්‍රශ්න අංක **21** සිට **25** තෙක් ඇති එක් එක් ප්‍රකාශයට **වඩාත් ගැළපෙන වරණය** පහත සඳහන් **K, L, M, N, O** යනුවෙන් නම් කර ඇති කලා කෘති ඇසුරෙන් තෝරන්න.


K


L


M


N


O

**21.** **K** අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය,
(1) මහාරාජ ලීලාවෙන් වැඩ හිඳින බෝසත් රුවකි.
(2) පොළොන්නරුවෙන් හමුවූ පද්මපානි බෝසත් රුවයි.
(3) අනුරාධපුර අවසාන භාගයේ දී හමුවූ අවලෝකිතේශ්වර බෝසත් රුවයි.
(4) හින්දු ආගමික බලපෑම් මත, වාත්තු ශිල්ප ක්‍රමය අනුව කළ ලෝකඩ පිළිමයකි.
(5) කුහර වාත්තු ක්‍රමයෙන් නිමකර රන් ආලේපිත පිළිමයකි. (.........)

**22.** **L** අක්ෂරයෙන් දැක්වෙන හෙන්රි මුවර්ගේ මූර්තිය,
(1) ශාස්ත්‍රාලයීය යථාරූපීකරණය විකෘති කිරීමකි.
(2) උද්‍යාන මූර්තියක් සඳහා ලෝකඩ මාධ්‍යයෙන් කළ නිර්මාණයකි.
(3) වැතිරී සිටින කාන්තාවකගේ ස්වරූපය අනුව කළ ප්‍රකාශනයකි.
(4) කාන්තාබව නිරූපණය කෙරෙන හැඩතල සංරචනයකි.
(5) කුහරමය අවකාශය තුළින් පරිසරය හා බැඳි දෘශ්‍යමය වූ ප්‍රකාශනයකි. (.........)

**23.** **M** අක්ෂරයෙන් දැක්වෙන ඩේවිඩ් ප්‍රතිමාව නිර්මාණයේ දී ශිල්පියා වඩාත් අවධානය යොමුකළේ,
(1) මානව කාය ව්‍යුහ ලක්ෂණ පිළිබඳ ඔහු සතු විශාරදබව පෙන්නුම් කිරීමට ය.
(2) සැහැල්ලු, නිදහස් හා රිද්මයානුකූල හැඩ ගොනු කිරීමට ය.
(3) කිරිගරුඬින් අනාබද්ධව හෙලනිස්ටික් යුගයේ පරමාදර්ශී ලක්ෂණ එක්කිරීමට ය.
(4) වීරයකු සතු පෞරුෂ ලක්ෂණ සහිත බලයේ සංකේතයක් නිර්මාණයට ය.
(5) තීක්ෂණ හා කල්පනාකාරී බැල්ම සහිත මානවවාදියෙකු නිර්මාණයට ය. (.........)

**24.** **N** අක්ෂරයෙන් නිරූපිත මයිකල් ආන්ජලෝගේ මෝසස් පිළිරුව නිර්මාණයේ අරමුණ වන්නේ,
(1) ගල් පුවරුවක් සහිත නිර්මාණයක් තුළින් දසපනත සංකේතවත් කිරීමයි.
(2) II වන ජුලියස් පාප්වහන්සේගේ සොහොන් කොත සංකේතවත් කිරීමයි.
(3) සිස්ටයින් දෙව්මැදුර තුළ ග්‍රීක සම්භාව්‍ය කලාවේ මූර්තිමය ලක්ෂණ දෘශ්‍යමාන කිරීමයි.
(4) භාව ප්‍රකාශනය මගින් ප්‍රඥාවේ මහිමය පෙන්වීමයි.
(5) දූරදර්ශී, දේහධාරී පඬිවරයෙකු නිරූපණය කිරීමයි. (.........)

**25.** **O** අක්ෂරයෙන් නිරූපිත ඊජිප්තු පිළිරුව,
(1) මිසර පැරණි රාජධානි යුගයට අයත් හුනු ගලින් නිර්මිත මූර්තියකි.
(2) සාම්ප්‍රදායික ලක්ෂණයන්ගෙන් මිදුනු නව රාජධානි යුගයේ මූර්තියකි.
(3) රාජකීයයකුගේ සේවකයකු නිරූපණය කරන්නකි.
(4) ලිවීමේ උපකරණ රැගත් ලියන්නකු නිරූපිත කැටයමකි.
(5) මධ්‍ය රාජධානි යුගයේ ක්‍රියාකාරීත්වය නිරූපිත මූර්තියකි. (.........)

PAST PAPERS WIKI

● ප්‍රශ්න අංක **26** සිට **30** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** තෝරන්න.

**26.** පහත දැක්වෙන සිත්තරුන් හා බැඳි කලා ව්‍යාපාර නිවැරදි අනුපිළිවෙළින් දක්වන්න.

**ජෝර්ජස් බ්‍රාක්, එඩ්ගා ඩෙගා, සැල්වදෝර් ඩාලි, වසිලි කැන්දින්ස්කි** හා **වින්සන්ට් වැංගෝ**

(1) වියුක්තිවාදී, පශ්චාත් උපස්ථිතිවාදී, ඝණිකවාදී, උපස්ථිතිවාදී, අධියථාර්ථවාදී
(2) උපස්ථිතිවාදී, අධියථාර්ථවාදී, පශ්චාත් උපස්ථිතිවාදී, වියුක්තිවාදී, ඝණිකවාදී
(3) පශ්චාත් උපස්ථිතිවාදී, අධියථාර්ථවාදී, ඝණිකවාදී, වියුක්තිවාදී, උපස්ථිතිවාදී
(4) ඝණිකවාදී, උපස්ථිතිවාදී, අධියථාර්ථවාදී, වියුක්තිවාදී, පශ්චාත් උපස්ථිතිවාදී
(5) අධියථාර්ථවාදී, ඝණිකවාදී, පශ්චාත් උපස්ථිතිවාදී, වියුක්තිවාදී, උපස්ථිතිවාදී (.........)

**27.** පෝස්ටරයක් යනු,
(1) කිසියම් තේමාවක් සංකේතවත්ව ප්‍රකාශ කෙරෙන මාධ්‍යයකි.
(2) කිසියම් පණිවුඩයක් සරලව, නිරවුල්ව, වේගවත්ව කෙරෙන ප්‍රචාරණ මාධ්‍යයකි.
(3) කාලීන තේමාවක් සිත්ගන්නා අයුරින් සමාජගත කෙරෙන ප්‍රබල දෘශ්‍ය මාධ්‍යයකි.
(4) සන්නිවේදන ක්‍රියාවලියේ වේගවත් ම ප්‍රචාරණ මාධ්‍යයයි.
(5) සංකීර්ණ තේමාවක් මුද්‍රිත මාධ්‍යයෙන් ප්‍රකාශ කෙරෙන සන්නිවේදනයකි. (.........)

**28.** යථාර්ථවාදය යනු,
(1) පර්යාලෝකය සහ ත්‍රිමාණ ලක්ෂණ යනාදී දෘශ්‍ය කලා මූලධර්ම නිවැරදිව ප්‍රකාශ කිරීමයි.
(2) ප්‍රකෘති ලෝකයේ ස්වභාවික හා නිර්මිත වස්තූන් ඇති සැටියෙන් චිත්‍රණය කිරීමයි.
(3) බටහිර ලෝකය හඳුන්වාදෙන ශාස්ත්‍රාලයීය මූලධර්ම සුරැකීමයි.
(4) යථා ලෝකයේ පවත්නා වස්තූන් වියුක්තරූපීව ප්‍රකාශ කිරීමයි.
(5) වස්තූන්ගේ සැබෑ ස්වරූපය බහුවිධමානයෙන් නිරීක්ෂණය කොට ප්‍රකාශ කිරීමයි. (.........)

**29.** පශ්චාත් උපස්තිථිවාදී නිර්මාණකරණයේ දී ශිල්පීන් වඩාත් අවධානය යොමු කරන ලද්දේ,
(1) උපස්තිථිවාදී ශිල්පක්‍රම නවතාවයකින් යුතුව ඉදිරියට පවත්වාගෙන යාමටයි.
(2) ඒකාකාරීව පවත්නා උපස්තිථිවාදී ශිල්පක්‍රම අතික්‍රමණය කිරීමටයි.
(3) නව අත්හදා බැලීම් හා ගැඹුරු භාව ප්‍රකාශන සහිත වස්තු විෂය ගවේෂණය කිරීමටයි.
(4) උපස්තිථිවාදීන් භාවිත කළ ශිල්පක්‍රම වෙනුවට නව ශිල්ප ක්‍රම ගවේෂණය කිරීමටයි.
(5) වස්තූන් කෙරෙහි, ආලෝකය දක්වන ප්‍රතික්‍රියාව ගවේෂණය කිරීමටයි. (.........)

**30.** වියුක්තිවාදය සඳහා පදනම වී ඇත්තේ,
(1) හඳුනාගත හැකි රූපයකින් තොරව කෙරෙන දෘශ්‍ය ප්‍රකාශනයන් ය.
(2) පරිකල්පනීය අරමුණු සහ ගොඩනගාගත් වියුක්ත හැඩ ප්‍රකාශනයන් ය.
(3) ස්වභාවධර්මයේ දෘශ්‍ය රූප ප්‍රතිනිර්මාණය හා සරලීකරණය කිරීම ය.
(4) ස්වභාවධර්මය හෝ එහි වස්තූන් ඒ ආකාරයෙන් ම අනුකරණය හෝ ප්‍රතිනිර්මාණය හෝ අත්හැර දැමීම ය.
(5) රේඛා මගින් ගොඩනගන ලද චලනමය, නම්‍යශීලි හැඩ හා වර්ණ හැසිරවීම ය. (.........)


● ප්‍රශ්න අංක **31** සිට **35** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** ඒට ඉදිරියෙන් දී ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් තෝරන්න.

**31.** ඇම්බැක්කේ දේවාලය වාස්තු විද්‍යාත්මකව වැදගත් වනුයේ,
(1) කතරගම දෙවියන් උදෙසා ඉදිකරන ලද නිසා ය.
(2) දෙල්මඩ මූලාචාරීන්ගේ විශිෂ්ට නිර්මාණයක් වීම නිසා ය.
(3) එහි පියස්ස නිර්මාණයේ දී යොදාගෙන ඇති නව නිර්මාණාත්මක අංග නිසා ය.
(4) දැව මාධ්‍යය කලාත්මක මුහුණුවරකින් භාවිතයට ගෙන ඇති ආකාරය නිසා ය.
(5) විවෘත මණ්ඩපයක් ලෙස ඉදිකර ඇති වාස්තු විද්‍යාත්මක සැලැස්ම නිසා ය.



(.........)

**32.** මෙහි දැක්වෙන්නේ,
(1) අනුරාධපුර යුගයේ තත්ථිකුච්ඡි විහාර වටදාගෙයයි.
(2) මණ්ඩප දෙකකින් යුතු තිරියාය වටදාගෙයයි.
(3) පොළොන්නරුවේ දළදා මළුවේ දක්නට ඇති වටදාගෙයයි.
(4) ගල්කණු පේළි දෙකක් මත පියස්ස රඳවන ලද මැදිරිගිරිය වටදාගෙයයි.
(5) අනුරාධපුර යුගයේ අම්බස්තල වටදාගෙයයි.



(.........)

**33.** මෙහි දැක්වෙන රාජ රාජේශ්වර දේවාලය,



(1) චෝල ගෘහ නිර්මාණ ලක්ෂණ අනුව තන්ජෝරයේ ඉදිවූ දෙවොලයි.
(2) කළුගල් භාවිතයෙන් ඉදිකර ඇති ව්‍යුහාත්මක දෙවොලයි.
(3) 1 වන රාජ රාජ රජු විසින් ඉදිකරන ලද විශාලත ම දෙවොලයි.
(4) ගෝපුරය සහිත විමාන හා ශිඛරයකින් යුතු හින්දු දෙවොලකි.
(5) දකුණු ඉන්දීය කලා සම්ප්‍රදායයන් අනුව ගලින් ඉදිකළ දෙවොලකි.

(………)


**34.** මෙහි දැක්වෙන්නේ,



(1) ක්‍රි.පූ. 2570 දී ඉදිකරන ලද විශාලතම පිරමීඩයයි.
(2) කාෆ්රේ රජු විසින් ඉදිකරන ලද දෙවන විශාලත ම පිරමීඩයයි.
(3) මිසරයේ විශාලතම පිරමීඩ ත්‍රිත්වය අතුරෙන් එකක් වන කුඩා පිරමීඩයයි.
(4) ඊජිප්තුවේ මධ්‍ය රාජධානි යුගයේ ඉදි වූ දෙවන විශාලතම පිරමීඩයයි.
(5) කාෆ්රේ පාරාවරුන්ගේ සොහොන් ගැබ ලෙස ඉදිකළ පිරමීඩයයි.

(………)

**35.** මෙහි දැක්වෙන්නේ,



(1) සමෝරා හේරා දෙවියන් වෙනුවෙන් කළ ඉරෙක්තියන් ගොඩනැගිල්ලේ අයොනික් කුලුණු ය.
(2) ඇතන්ස්හි සියුස් දෙවියන් වෙනුවෙන් කළ දෙවොලේ කොරින්තියන් කුලුණු ය.
(3) ඇතීනා දෙවඟන වෙනුවෙන් කළ පාතිනොන් දෙවොලේ ඩොරික් කුලුණුය.
(4) ඇතන්ස්හි සියුස් දෙවියන් වෙනුවෙන් කළ දෙවොලේ අයොනික් කුලුණු ය.
(5) ඇතීනා දෙවඟන වෙනුවෙන් කළ පාතිනොන් දෙවොලෙහි කොරින්තියන් කුලුණු ය.

(………)

- ප්‍රශ්න අංක **36** සිට **40** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට **වඩාත් ගැළපෙන වරණය** පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



**36.** ලංකා කලා සංගමයේ, ඒ. සී. ජී. එස්. අමරසේකර ශිල්පියා,
(1) පෙරදිග චිත්‍ර ශෛලීන් ගුරුකොට ගත් අයෙකි.
(2) ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී රීතීන් අනුගමනය කළ අයෙකි.
(3) වෘතාන්ත චිත්‍රකරණයට ඇල්මක් දැක්වූවෙකි.
(4) සාම්ප්‍රදායික චිත්‍රවල ක්‍රමවේද අනුකරණය කළ අයෙකි.
(5) තමාට ම ආවේණික සම්ප්‍රදායයක් අනුගමනය කළ අයෙකි.

(………)

**37.** මෙහි තේමාව තුළින් නිරූපණය කර ඇත්තේ,
(1) යථාර්ථවාදීව මානව රූ චිත්‍රණය කිරීමට ගත් උත්සාහයකි.
(2) මධ්‍යම පන්තියේ පවුල් ජීවිතය පිළිබඳ කළ විග්‍රහයකි.
(3) පීඩිත පන්තියේ දරිද්‍රතාව පිළිබඳ ප්‍රකාශ කිරීමකි.
(4) ග්‍රාමීය ජීවිතය පිළිබඳ සංකේතවත්ව කළ විග්‍රහයකි.
(5) ගැමි දිවියේ දුක්ඛිත අවස්ථාවක් ප්‍රතිනිර්මාණය කිරීමකි. (………)

**38.** සංරචනයේ මූලික අරමුණ වූයේ,
(1) මානව ඉරියව් සිද්ධියට අනුරූපව තත්ත්වාකාරයෙන් ගොනු කිරීමයි.
(2) මානව රූ මෙන් ම විවිධ වස්තූන් එකිනෙකට ගැළපෙන අයුරින් ඉදිරිපත් කිරීමයි.
(3) මානව රූපවලට වඩා ප්‍රකාශිත වස්තූන්ට ප්‍රමුඛතාවක් ලබාදීමයි.
(4) තේමාව විග්‍රහ කිරීමට අදාළව රූප ගණනාවක් සංකේතවත්ව භාවිත කිරීමයි.
(5) වර්ණ සංකලනය කිරීම තුළින් හැඟීම් ප්‍රකාශනයට මුල්තැනක් දීමයි. (………)

**39.** 'වඩුවාගේ ගෙදර' සිතුවමේ
(1) සම්භාව්‍ය වර්ණමාලාවක් ප්‍රශස්ත ලෙස තෙල් සායම් මාධ්‍යයෙන් නිම කර ඇත.
(2) ස්වාභාවිකත්වය අනුකරණය කිරීම සඳහා උචිත වර්ණ යොදා ඇත.
(3) ආලෝකය හා අඳුර අතර ප්‍රබල ප්‍රතිවිරෝධතා මතුවන ලෙස වර්ණ භාවිත කර ඇත.
(4) බහුවාර්ණික ලක්ෂණ ඇති සම්භාව්‍ය වර්ණ මාලාවක් භාවිත කර ඇත.
(5) වර්ණ භාවිතයේ දී පැහැයෙහි වෙනස්වීම පියෙවි පෙනුමෙන් මතු කර ඇත. (………)

**40.** හැඟීම් ප්‍රකාශනය පිළිබඳ වඩාත් උචිත ප්‍රකාශය තෝරන්න.
(1) මධ්‍යම පාන්තික සමාජයේ දරිද්‍රතාව මානව රූවලින් ප්‍රකාශ කර ඇති අයුරු අගනේ ය.
(2) මානව රූව හැඟීම් ප්‍රකාශවන අයුරින් යොදා ගෙන ඇති අයුරු ප්‍රශස්ත ය.
(3) සංකේත භාවිත කරමින් ප්‍රකාශනය ඉස්මතු කිරීමට ගත් උත්සාහය අගනේ ය.
(4) යථාරූපීව, හැඟීම් දනවන අයුරින් මානව රූ ඇතුළු සමස්තය චිත්‍රණය කර ඇති අයුරු අගය කළ හැකි ය.
(5) මානව රූපවල බාහිර සුන්දරත්වය මෙන් ම අභ්‍යන්තර හැඟීම් ප්‍රකාශනයට ගත් උත්සාහය විශිෂ්ට ය. (………)

* *

PAST PAPERS WIKI

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

51 S I

## II කොටස

* මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත ය.
* 'අ' කොටසින් ප්‍රශ්න **දෙකක්** හා 'ආ' සහ 'ඉ' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
(අවශ්‍ය තැන්හි පිළිතුරු සවිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)

## 'අ' කොටස

### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

**1.** අනුරාධපුර යුගයේ ඇරඹි නව වාස්තු විද්‍යා ප්‍රබෝධය බෞද්ධාගමික වාස්තු විද්‍යා නිර්මාණ රැසක් බිහිවීමට හේතු විය.

(i) භික්ෂූන් වහන්සේලා සඳහා නිර්මාණය කරන ලද සර වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නිල්ලක්ගම බෝධිඝරය ගැන කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05 යි)

(iii) අනුරාධපුර ඉදිවූ කුට්ටම් පොකුණ සහ පොළොන්නරුවේ ඉදිවූ නෙළුම් පොකුණ අගනා ශෛලමය නිර්මාණයන් ය. ආකෘතිය හා ශිල්පීය කුසලතාව පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි)

**2.** ශ්‍රී ලංකාවේ ආගමික සිතුවම් නිර්මාණකරණයේ නියැලුණු චිත්‍ර ශිල්පීහු විවිධ තේමා යටතේ විශිෂ්ට නිර්මාණ බිහි කළෝ ය.

(i) නාරායන ස්වාමි ශිල්පියා විසින් වැල්වැටිතුරෙයි මුත්තු අම්මාන් කෝවිලෙහි ඇඳ ඇති සිතුවම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඩේවිඩ් පේන්ටර් ශිල්පියා විසින් සිතුවම් කරන ලද මහනුවර ත්‍රිත්ව දෙව් මැදුරේ දක්නට ලැබෙන 'යහපත් සමරිතානුවා' සිතුවම පිළිබඳ කෙටි ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි)

(iii) 'මාර පරාජය' බෞද්ධාගමික චිත්‍ර ශිල්පීන් විසින් විවිධාකාරයෙන් සිතුවමට නගා ඇත. බොරැල්ලේ ගෝතමී විහාරයේ සිතුවම් ඇඳි ජෝර්ජ් කීට් ශිල්පියා හා බෙල්ලන්විල රජමහා විහාරයේ සිතුවම් ඇඳි සෝමබන්දු විද්‍යාපති ශිල්පියා 'මාර පරාජය' සිතුවම් කළ ආකාරය පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි)

**3.** පොළොන්නරු යුගයේ දී හින්දු ආගමික සංකල්ප මත පදනම්ව ආගමික මූර්ති ගණනාවක් දේවාල ආශ්‍රිතව නිර්මාණය කර ඇත.

(i) හින්දු ආගමික මූර්ති නිර්මාණයේ දී භාවිත කළ ශිල්ප ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශිව සෝමස්කන්ධ මූර්තිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි)

(iii) හින්දු ආගමික මූර්ති අතර නටරාජා මූර්තිය සුවිශේෂී වේ. එහි සංකේත භාවිතය හා කලා ලක්ෂණ පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

[දහවැනි පිටුව බලන්න.

## 'ආ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

**4.** ගන්ධාර හා මථුරා ගුරුකුල බෞද්ධාගමික මූර්ති රැසක් ලොවට බිහි කළ කලා මධ්‍යස්ථානයන් ය.

(i) ගන්ධාර කලා සම්ප්‍රදායේ නිර්මාණය වූ ප්‍රතිමා **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය සඳහා ගන්ධාර කලා සම්ප්‍රදාය ඉවහල් වී ඇති ආකාරය කෙටියෙන් පහදන්න. (ලකුණු 05 යි)

(iii) මථුරා හා සාරානාත් ගුරුකුලයන්හි නිර්මාණ ගුප්ත යුගයේ දී ඉතා උසස් තත්ත්වයට පත් විය. ඉහත කියමන සනාථ කිරීම සඳහා මථුරා හා සාරානාත් බුදු පිළිමවල ප්‍රශස්ත මූර්තිමය ලක්ෂණ හා භාව ප්‍රකාශන ඇසුරෙන් පහදන්න. (ලකුණු 08 යි)

**5.** ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ඉතා දියුණු ජන කොට්ඨාසයක් විසූ පෞරාණික ජනාවාසයකි.

(i) ඉන්දු නිම්න වැසියෝ කලා කෘති නිර්මාණයේ දී භාවිත කළ ශිල්ප ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉන්දු නිම්න වැසියෝ මානව රූව සියුම්ව අධ්‍යයනය කොට නිර්මාණය කිරීමට දක්ෂතා ඇත්තෝ වූහ. **එක්** උදාහරණයක් ගෙන කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි)

(iii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ ඉතා දියුණු ගෘහ නිර්මාණ තාක්ෂණයක් පැවති බවට සාක්ෂි හමුවී ඇත. ඉහත කියමන ඔවුන්ගේ වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් උදාහරණ සහිතව පහදන්න. (ලකුණු 08 යි)

## 'ඉ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

**6.** යුරෝපයේ තදාසන්න රාජ්‍යයන් දෙකක් වන ග්‍රීසිය හා රෝමය කලා නිර්මාණ රැසක් ලොවට දායාද කළ දේශයන් විය.

(i) ග්‍රීක සම්භාව්‍ය යුගයේ මූර්ති **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) රෝම වාස්තු විද්‍යාවේ සුවිශේෂී නිර්මාණයක් වූ ට්‍රාජන් කුලුණ (The Trajan Column) ගැන කෙටි කලාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 05 යි)

(iii) ග්‍රීක හා රෝම ශිල්පීන් මානව රූපය, සිතුවම් සඳහා යොදා ගත් ආකාරය හා අවස්ථාවන් ඇසුරෙන් සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

**7.** ඉතාලියේ බිහි වූ පුනරුද සමය, අග්‍රගණ්‍ය කලා කෘති රැසක් ලොවට බිහිකළ අවධියකි.

(i) මයිකල් ඇන්ජලෝ විසින් නිර්මාණය කරන ලද සිතුවම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පුනරුද කලාවේ පොදු ලක්ෂණ පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05 යි)

(iii) ලියනාඩෝ ඩාවින්චිගේ 'පර්වත මස්තකයේ දේවමෑණියෝ' සහ රෆායෙල් සන්සියෝගේ 'ඇල්බා මැඩෝනා' යන සිතුවම් පිළිබඳ ආකෘතිය හා කලා ලක්ෂණ ඇතුළත් සංසන්දනාත්මක කලාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

චිත්‍ර කලාව II
சித்திரக்கலை II
Art II

51 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් අධ්‍යයනය කිරීම සඳහා යොදාගන්න.**

**උපදෙස්:**

- ඔබේ **විභාග අංකය**, ඔබ චිත්‍රය අඳින කඩදාසියේ **පසුපිටෙහි** පැහැදිලිව ලියන්න.
- ඔබ වෙත සපයා ඇති විශේෂ **ඇඳීමේ කඩදාසිය** (Drawing paper) වර්ණ චිත්‍රය ඇඳීම සඳහා භාවිත කරන්න. වෙනත් කිසිම චිත්‍රයක් හෝ අධ්‍යයන සටහනක් ඇඳීම අවශ්‍ය නොවේ.
- ඔබගේ චිත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය සම්පූර්ණයෙන් ම වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින්, එය ඔබට අවාසිදායක විය හැකි ය.

## ස්වභාවිකත්ව අධ්‍යයනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය

පහත සඳහන් උපදෙස් සැලකිල්ලට ගෙන ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය ඇඳ, වර්ණ කරන්න.

* කඩදාසියේ තලය, අර්ථවත්ව භාවිත කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න.
* ද්‍රව්‍යයන්ගේ ගතිලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණය, ඇස් මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාලෝක රීති පිළිබඳ සැලකිලිමත් වන්න.
* ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ, ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැලකිල්ලට ගෙන වර්ණ කරන්න.
* වර්ණ මාධ්‍යය හැසිරවීමේ ශිල්ප ක්‍රම අර්ථවත්ව භාවිත කරන්න.
* ද්‍රව්‍ය සමූහයට ගැළපෙන පරිදි වර්ණවත් පසුබිමක් යොදන්න.
* ද්‍රව්‍ය සමූහය තබා ඇති ධාරකයේ (ලෑල්ලේ) පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැළපෙන පරිදි වෙනස් කරගැනීමට හැකි ය.
* දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් යන එක් මාධ්‍යයක් හෝ මාධ්‍ය කිහිපයක් මිශ්‍රිතව හෝ භාවිත කළ හැකි ය.

* * *

Past Papers Wiki
PAST PAPERS WIKI

Past Papers Wiki



සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

| | |
|---|---|
| චිත්‍ර කලාව | III |
| சித்திரம் | III |
| Art | III |

51 S III

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

| | | |
|---|---|---|
| අමතර කියවීම් කාලය | - | මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - | 10 நிமிடங்கள் |
| Additional Reading Time | - | 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

※ ඔබේ **විභාග අංකය** හා තෝරාගත් **ප්‍රශ්න අංකය** ඔබ චිත්‍රය අඳින කඩදාසියේ **පසුපිටෙහි** පැහැදිලි ව ලියන්න.

※ දිය සායම්, පෝස්ටර් සායම්, කුඩු සායම්, පැස්ටල් යන එක් මාධ්‍යයක් හෝ මෙම මාධ්‍යයන් කිහිපයක් මිශ්‍රිත ව හෝ භාවිත කළ හැකි ය.

※ අවශ්‍ය අයට ඩ්‍රිලු කඩදාසි සපයනු ලැබේ.

※ චිත්‍රය භාර දෙන විට, එය සම්පූර්ණයෙන් ම වියළී තිබීම වැදගත් ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින් එය ඔබට අවාසිදායක විය හැකි ය.

● පහත සඳහන් **අ, ආ** සහ **ඉ** යන කොටස් තුන අතුරෙන් **එක්** මාතෘකාවක් **පමණක්** තෝරාගෙන, වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

1. රිළවුන් රංචුවකට මැදි වූ සංචාරකයින් පිරිසක්
2. ගැමි පරිසරයක රූකඩ නාට්‍යයක් රූගත කරන අවස්ථාවක්
3. දන්සලක ඔබ සිත්ගත් අවස්ථාවක්
4. දැඩි වර්ෂාව හා සුළඟින් පීඩා විඳින පදිකයින්

## 'ආ' කොටස - මෝස්තර නිර්මාණය

5. විෂ්කම්භය අඩි 4ක් වූ වෘත්තාකාර මේසයකට සුදුසු පැත්තක් අඩි 6ක් වූ සමචතුරස්‍රාකාර මේස රෙද්දක් මධ්‍ය ලක්ෂ්‍යය පාදක කොට ගෙන වෘත්තාකාරව විහිදී යන අයුරින් මුළුතල මෝස්තරයක් සාම්ප්‍රදායික උද්භිද හා සත්ත්ව හැඩතල ඇසුරෙන් සැලසුම් කර වර්ණ කරන්න. (ප්‍රමාණය පරිමාණානුකූලව සකසා ගන්න.)
6. යානවාහනවල හැඩතල කිහිපයක් මෝස්තර ඒකකයක් ලෙස භාවිත කර කමිස රෙද්දක් සඳහා සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් 9" × 9" (අඟල්) ප්‍රමාණයට සැලසුම් කර වර්ණ ගන්වන්න.
7. ජලජ ජීවී සංරක්ෂණ ජාතික මට්ටමේ වැඩමුළුවක පිවිසීමේ දොරටුව ඉදිරියේ ප්‍රදර්ශනය කිරීමට උචිත 6' × 12' (අඩි) ප්‍රමාණයේ පතාකයක් සැලසුම් කර වර්ණ ගන්වන්න. (ප්‍රමාණය පරිමාණානුකූලව සකසා ගන්න.)

## 'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

8. 'අහිමි සෙනෙහස' නමින් ලියැවුණු නිසදැස් කවි පෙළක් සඳහා එහි අන්තර්ගතය විග්‍රහ වන පරිදි සන්නිදර්ශන චිත්‍රයක් ව්‍යුක්තරූපී හැඩතල ඇසුරෙන් නිර්මාණය කරන්න.
9. 'ප්‍රාග් ඓතිහාසික චිත්‍ර කලාව' නමින් ලියැවුණු පොතකට සුදුසු පිට කවරයක් සැලසුම් කර වර්ණ කරන්න. (මුල් පිටුව, සනකම හා පසු පිටුව ඇතුළත් විය යුතු ය.)
10. දේශීයව නිෂ්පාදිත කාන්තා සුවඳ විලවුන් බෝතලයක් විදේශීය වෙළෙඳපොළට හඳුන්වාදීමට උචිත ආකාරයේ ඇසුරුමක් විකසනය දැක්වෙන අයුරින් සැලසුම් කර වර්ණ ගන්වන්න.

※※※

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library